# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ  அதிவிசேஷமானது  EXTRAORDINARY

අංක 832/9—1994 අගෝස්තු 17 වැනි බදාදා—1994.08.17

832/9 ஆம் இலக்கம் — 1994 ஆம் ஆண்டு ஒகத்து மாதம் 17 ஆம் திகதி புதன்கிழமை

No. 832/9 – WEDNESDAY, AUGUST 17, 1994

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)  (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது)  (Published by Authority)


## IV (අ) වැනි කොටස—පළාත් සභා

### පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ, පළාත් සභාවේ, 1994 වර්ෂයේ අංක 01 දරන සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය**

නිවේදනයයි

බස්නාහිර පළාතේ, සමුපකාර විෂයය භාර අමාත්‍ය රත්නසිරි වික්‍රමනායක වන මම, බස්නාහිර පළාත් සභාවේ, 1994 වර්ෂයේ අංක 01 දරන සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ අංක 01 දරන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, 1994 වර්ෂයේ අංක 01 දරන සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය මෙයින් ප්‍රකාශයට පත් කරමි.

රත්නසිරි වික්‍රමනායක,<br>
බස්නාහිර පළාතේ පළාත් සභාවේ සමුපකාර<br>
විෂය භාර අමාත්‍ය.

1994 ජූලි මස 21 වැනි දින,<br>
කොළඹ දී ය.

**බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1994 වර්ෂයේ අංක 01 දරන සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය**

***බස්නාහිර පළාත් සමුපකාර සේවක කොමිෂන් සභාවක් ඇති කිරීම සඳහා ද, බස්නාහිර පළාත් සමුපකාර සමිති සේවකයින් සඳහා විශේෂ විධි විධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ වූ හා අනුෂාංගික කරුණු සඳහා විධි විධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.***

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාත් සභාවේ 1994 වර්ෂයේ අංක 01 දරන සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තිය යනුවෙන් හැඳින්විය හැකි අතර, බස්නාහිර පළාත් සභාවේ අනුමැතිය ලැබීමෙන් පසු ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු එදින සිට වලංගු වේ. (මින්පසු පත්කරනු ලැබූ දිනය යනුවෙන් මෙය හැඳින්වේ.) — ලුහුඬු නාමය සහ වලංගු දිනය.

GP 3281



*සමුපකාර සමිති මේ ප්‍රඥප්තියේ මතුවට එන විධි විධාන වලින් නිදහස් කිරීම පිළිබඳ ඇමතිවරයා සතු බලතල.*

02. ඇමතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන ආඥාවකින් —

(අ) එහි නිශ්චිතව සදහන් කරනු ලැබිය යුතු යම් සමුපකාර සමිති පන්තියක් ; හෝ

(ආ) එසේ නිශ්චිත සදහන් කරනු ලැබිය යුතු යම් සමුපකාර සමිතියක්,

මේ ප්‍රඥප්තියේ මතුවට එන විධි විධානවලින් නිදහස් කළ හැකි අතර, ඒ අනුව " සමුපකාර සමිතිය " යන යෙදුම ඒ විධි විධානවල යෙදෙන කවර ස්ථානයක වුවද එවැනි ආඥාවක් තත් කාලයෙහි වලංගුව බල නොපවත්නා සමුපකාර සමිතියක් බව එයින් අදහස් වන ලෙස කියවා තේරුම් ගත යුතුය.

## 1 වැනි කොටස

### බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ සංස්ථාපනය, බලතල සහ කාර්යයන්

*සමුපකාර සේවක කොමිෂන් සභාව පිහිටුවීම.*

03. මේ ප්‍රඥප්තියේ කාර්යයන් සදහා බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව යනුවෙන් හදුන්වනු ලබන හා දන්නා අධිකාරියක් පිහිටවනු ලැබිය යුතුය.

*කොමිෂන් සභාවේ සංයුතිය.*

04. (1) මේ වගන්තියේ මතුවට එන විධි විධාන අනුව කොමිෂන් සභාව සංස්ථාපනය විය යුතුය.

(2) පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ඇමතිවරයා විසින් පත්කරනු ලබන තුන්දෙනෙකුගෙන් කොමිෂන් සභාව සමන්විත විය යුතුය.

(3) යම් තැනැත්තෙකු —

(අ) සමුපකාර සමිතියක සේවකයෙකු හෝ හිටපු සේවකයෙකු නම් ; හෝ

(ආ) ඇමතිවරයාගේ මතය අනුව, සමුපකාර සමිති විසින් සේවයෙහි යොදවා ගනු ලබන යම් වර්ගයකට අයත් තැනැත්තන්ගේ වැටුප, වේතන හෝ සේවා කොන්දේසි සකස් කිරීම අරමුණ වශයෙන් ඇති හෝ අරමුණුවලින් එකක්ව ඇති යම් කාර්ය මාණ්ඩලික සංගමයක හෝ වෘත්තීය සමිතියක සාමාජිකයෙකුව සිටින තැනැත්තෙකු නම් ; හෝ

(ඇ) සමුපකාර සමිති පිළිබඳ නීතිය අනුව සමුපකාර සමිතියක නිලධාරියෙකුව සිටින තැනැත්තෙකු නම් ; හෝ

(ඈ) තත්කාලයෙහි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුව හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙක්ව හෝ වෙනත් පළාත් පාලන ආයතනයක සභිකයෙක්ව සිටින තැනැත්තෙක් නම් ; හෝ

ඒ තැනැත්තා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත්කිරීම නුසුදුසු විය යුතුය.

*කොමිෂන් සභාව නීතිගත සංස්ථාවක් විය යුතු බව.*

05. කොමිෂන් සභාව අවිච්ජින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් ඇති නීතිගත සංස්ථාවක් විය යුතු අතර, එහි නීතිගත සංස්ථා තත්ත්වයෙන් එය විසින් හා එයට විරුද්ධව නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම කළ හැකි විය යුතුය.

*සාමාජිකයින්ගේ ධූර කාලය.*

06. කොමිෂන් සභාවේ එක් එක් සාමාජිකයා තම පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලසීමාවක් ධූරය දැරිය යුතුය.

එසේ වුවද එවැනි පත්වීමක ධූර කාලය ගැන නොතකා —

(අ) එවැනි සාමාජිකයෙකු විසින් යම් අවස්ථාවක තම ධූරයෙන් ඉල්ලා අස්වීම හෝ ඇමතිවරයා විසින් ඔහු ධූරයෙන් ඉවත් කිරීම කළ හැකිය. තව ද ,

(ආ) එවැනි යම් සාමාජිකයෙකු 4 (3) වැනි වගන්තිය අනුව නුසුදුසුවීමෙන් පසු ඒ හේතුවෙන්ම සිය ධූරය හිස් කළ යුතුය.

එසේම, තවදුරටත්, එවැනි යම් සාමාජිකයෙකු මිය යැමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ ධූරය හිස් කිරීමෙන් ඇති වන යම් පුරප්පාඩුවක් පිරවීම සඳහා පත්කරනු ලබන යම් තැනැත්තකු විසින් තමා පත්කරනු ලැබුවේ යම් සාමාජිකයෙකු වෙනුවට ද, ඒ සාමාජිකයාගේ ධූර කාලයෙන් ගත නොවී ඇති කොටසට සමාන කාලයක් මුත් ඊට වැඩි කාලයක් ඒ ධූරය නොදැරිය යුතුය.

*කොමිෂන් සභාවේ සභාපති සහ එහි කටයුතු පවත්වා ගෙන යාම.*

07. (1) ඇමතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයින්ගෙන් කෙනෙකු එහි සභාපති වශයෙන් පත් කළ යුතුය. සභාපති පැමිණ සිටින අවස්ථාවල දී කොමිෂන් සභාවේ සියළුම රැස්වීම්වල දී ඔහු මූලාසනය දැරිය යුතුය. කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සභාපති පැමිණ නොසිටියහොත්, පැමිණ සිටින සාමාජිකයින් දෙදෙනාගේ එකඟත්වය ඇතිව ඔවුන් අතුරින් එක් අයෙකු විසින් මූලාසනය දැරිය යුතුය.

(2) කොමිෂන් සභාවේ රැස්වීමකට සනපූරණය සාමාජිකයන් දෙදෙනෙකු විය යුතුය.

(3) කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සාමාජිකයන් දෙදෙනකු පමණක් පැමිණ සිටියහොත් හා යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් කළ යුතු තීරණය පිළිබඳව සාමාජිකයන් අතර, මතය වෙනස් වුවහොත් ඒ ප්‍රශ්නය කොමිෂන් සභාවේ සාමාජිකයන් තුන්දෙනාම පැමිණ සිටින රැස්වීමක් වෙත යොමු කළ යුතුය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකයින් තුන් දෙනාම පැමිණ සිටින යම් රැස්වීමක දී යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් දිය යුතු තීරණය පිළිබඳව කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර, මතය වෙනස් වුවහොත් ඒ ප්‍රශ්නය පැමිණ සිටින සාමාජිකයින් වැඩිදෙනාගේ මතය අනුව තීරණය කළ යුතු ය. එහෙත් සමාජිකයන් සමානව බෙදුනහොත් සභාපතිට තීරක ඡන්දයක් තිබිය යුතුය.

(5) මේ ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ පණවනු ලැබූ යම් නියෝගයක විධි විධාන සළස්වා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ස්වකීය කාර්යය පරිපාටිය විධිමත්ව කළ හැකිය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර, පුරප්පාඩුවක් තිබීම නිසා හෝ සාමාජිකයන් පත් කිරීම පිළිබඳව අඩු පාඩුවක් තිබීම නිසා හෝ කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ කෘත්‍යයක් අවලංගු නොවිය යුතුය.

*සාමාජිකයන්ට ගෙවීම*

08. කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයින්ට පළාතේ මූල්‍ය විෂයය භාර පළාත් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයන් හා දීමනා ගෙවිය යුතුය.

*ලේකම් සහ සෙසු නිලධාරීන්*

09. කොමිෂන් සභාවේ ලේකම්වරයකු සහ ඔහුට සහාය වීම පිණිස කාර්ය මණ්ඩලයක් විය යුතුය.

*කොමිෂන් සභාවේ සාමාජිකයන් සහ නිලධාරීන් දිවුරුම් දීම*

10. (1) කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් ඔවුන්ගේ පළමු පත්වීමේදී මේ ප්‍රඥප්තියේ උපලේඛනයෙහි දක්වෙන ආකෘතියෙහි වූ දිවුරුමක් හෝ සහතික ප්‍රකාශයක් කළ යුතුය.

(2) කොමිෂන් සභාවේ ලේකම් විසින් හා දිවුරුමක් හෝ සහතික ප්‍රකාශයක් කළ යුතුයැයි කොමිෂන් සභාවේ සභාපති විසින් නියම කළ හැකි කොමිෂන් සභා සෙසු නිලධරයන් විසින් ඔවුන්ගේ පළමු පත්වීමේදී මේ ප්‍රඥප්තියේ උපලේඛනයෙහි දක්වෙන ආකෘතියෙහි වූ දිවුරුමක් හෝ සහතික ප්‍රකාශයක් කළ යුතු ය.

*කොමිෂන් සභාව සතු බලතල*

11. (1) කොමිෂන් සභාවට පහත සඳහන් බලතල තිබිය යුතුයි.—

(අ) සමුපකාර සමිතිවල සේවකයින් බඳවා ගැනීමේ ක්‍රමවලට අදාළ සියළු කරුණු හා ඔවුන්ගේ සේවා කොන්දේසි ද පත්කිරීමේ දී හා සමුපකාර සමිතියක හෝ එක් තනතුරකින් ඒ සමිතියේම තවත් තනතුරකට උසස් කිරීමේ දී සමිති විසින් අනුගමනය කළයුතු ප්‍රතිපත්ති නිශ්චය කිරීම ;

(ආ) සමුපකාර සමිතිවල සේවකයින් බඳවා ගැනීම සඳහා විභාග පැවැත්වීම හෝ ඒ විභාග පැවැත්වීමේ කාර්යය සඳහා පරීක්ෂක මණ්ඩල පත්කිරීම හා විභාගවලට පෙනී සිටින අපේක්ෂකයින්ගෙන් ගාස්තු අයකිරීම ;

(ඇ) එවැනි යම් තනතුරකට පත්කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරීම, යම් පන්තියක හෝ එවැනි යම් තනතුරකට හෝ තනතුරුවලට අනුයුක්ත කළ යුතු වැටුප් ක්‍රමය නියම කිරීම කොමසාරිස් විමසා ඒ වැටුප් ක්‍රම කලින් කල ප්‍රතිශෝධනය කිරීම හෝ සකස් කිරීම හා සමුපකාර සේවකයින්ගේ පාරිශ්‍රමික හා සේවා කොන්දේසි නිශ්චය කිරීමේ දී කොමිෂන් සභාවට සහායවීම පිණිස කොමිෂන් සභාව විසින් අවශ්‍යයැයි සැලකිය හැකි උපදේශක කාර්යය සංවිධාන පිහිටුවීම ;

(ඈ) යම් පන්තියක හෝ වර්ගයක යම් තනතුරක් හෝ තනතුරු සඳහා කොමිෂන් සභාව විසින් නියමකරන ලද වැටුප් ක්‍රම අනුව වැටුප් ගෙවන ලෙස සමුපකාර සමිතිවලට නියම කිරීම ;

(ඍ) තම සේවකයින්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කිරීමේ අධිකිවාසිකම් ක්‍රියාවෙහි යෙදවීමෙහිලා යම් සමුපකාර සමිතියක් විසින් අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය හෝ පරිපාටී නිශ්චය කිරීම, සේවකයින්ට විරුද්ධව විනයානුකූල පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කාලයක් ඇතුළත දී අවසාන කරන ලෙසද සමුපකාර සමිතියකට නියම කිරීම හා යම් සමුපකාර සමිතියක් විසින් කරනු ලැබූ විනයානුකූල නියෝගයකට විරුද්ධව පැනනගින ආයාචනා විභාග කිරීම ;

(ඎ) යම් සමුපකාර සමිතියකට එහි සේවකයින්ට අදාළ නියමිත සටහන් තබන ලෙස නියම කිරීම ;

(ඏ) යම් සමුපකාර සමිතියක යම් සේවකයෙකු සම්බන්ධයෙන් කොමිෂන් සභාවට අවශ්‍ය විය හැකි ලිපිගොනු, වෙනත් ලේඛන හෝ තොරතුරු නිශ්චිතව නියමිත දිනයකට පෙර සපයන ලෙසත්, ඒ සමිතියට නියා සිටීම ;

(ඐ) කොමිෂන් සභාව වෙත යොමු කළ අභියාචනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පවත්වා කොමිෂන් සභාව වෙත වාර්තා කිරීම පිණිස නිලධාරීන්ගෙන් සමන්විත අභියාචනා පරීක්ෂණ නිලධාරී හා නිලධාරී මණ්ඩල නම් කිරීම ;

(එ) යම් සමුපකාර සමිතියක සේවකයෙකුගේ ක්‍රියාකලාපය පරීක්ෂණයකට විෂයවී තිබීම හේතුවෙන් ඒ සේවකයා විසින් සමිතියේ තීරණයකට විරුද්ධව කොමිෂන් සභාව වෙත ආයාචනා කර ඇති අවස්ථාවක ඔහු නැවත සේවයට ගැනීම පිළිබඳව උපදෙස් ඇතුළුව ඒ සේවකයා සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් දෙනු ලැබිය හැකි උපදෙස් ක්‍රියාත්මක කරන ලෙසට ඒ සමුපකාර සමිතියට නියම කිරීම ;

(ඒ) සේවකයන්ගේ සේවය අවසන්වීමේ දී පාරිතෝෂික හෝ වෙනත් ප්‍රතිලාභ වශයෙන් ඔවුන්ට ප්‍රදානය කළ හැක්කේ යම් සාමාන්‍ය ප්‍රතිපත්ති අනුවද ඒ ප්‍රතිපත්ති නියම කිරීම ;

(ඔ) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීමෙන් යම් සමුපකාර සමිතියක් හෝ යම් පන්තියක සමුපකාර සමිති නිදහස් කිරීම සම්බන්ධයෙන් කොමසාරිස් විමසා ඇමතිවරයාට උපදෙස්දීම ; හා

(ඕ) පළාත් සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ඇමතිවරයා විසින් පනවනු ලැබූ ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන ආඥාවකින් කොමිෂන් සභාව වෙත පවරනු ලැබිය හැකි, සමුපකාර සමිතිවලට හා ඒවායේ සේවකයින්ට අදාළ වෙනත් බලතල ක්‍රියාවෙහි යෙදවීම.

(2) 1 වැනි උප වගන්තියෙන් කොමිෂන් සභාව වෙත පැවරුනු බලතල ක්‍රියාවෙහි යෙදවීමේ දී කොමිෂන් සභාව විසින් කරන ලද යම් තීරණ හෝ නිශ්චය කිරීම්, වෙනස් කිරීම්, අවලංගු කිරීම් හෝ ප්‍රතිශෝධනය කිරීම හෝ ඉවත දැමීම කොමිෂන් සභාව විසින් කළ හැකිය.

**මූල්‍ය ප්‍රතිපාදන.**

12. කොමිෂන් සභාවේ වියදම් වාර්ෂිකව පළාත් සභාව විසින් වාර්ෂික අයවැය ලේඛනයෙන් සහ පරිපූරක ඇස්තමේන්තුවලින් ඒ සඳහා ප්‍රතිපාදනය කරනු ලබන මුදල්වලින් ගෙවිය යුතුය

## 2 වැනි කොටස

### සමුපකාර සමිති සහ ඒවායේ සේවකයෝ

**සමුපකාර සමිතිය සේවායෝජක ලෙස සැලකීම.**

13. යම් සේවකයෙකුගේ වැටුප හා වෙනත් පඩිනඩි සමිතියේ මුදල්වලින් තත්කාලයෙහි ගෙවන සමුපකාර සමිතියක් ඒ සේවකයාගේ සේවා යෝජකයා ලෙස සලකනු ලැබිය යුතුය.

**සමුපකාර සමිති සහ ඒවායේ සේවකයන් කොමිෂන් සභාවේ විධිවිධානවලට යටත්විය යුතු බව.**

14. සමුපකාර සමිතියක් හා ඒ සමිතියේ කවර සේවකයෙකු වුවද මේ ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාව විසින් කරනු ලැබිය හැකි විධානවලට යටත්විය යුතු අතර, මේ ප්‍රඥප්තිය යටතේ කොමිෂන් සභාවේ කාර්යයන් හා බලතල ඉටුකිරීමෙහි හා ක්‍රියාවෙහි යෙදවීමෙහි ලා කෙරෙන කොමිෂන් සභාවේ සියළු තීරණ II(2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව අවසානාත්මක විය යුතුවත් හැර ඇමතිවරයා විසින් 2 වැනි වගන්තිය යටතේ කරන ලද ආඥාවකින් මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීමෙන් නිදහසක් නොකරන ලද සියළු සමුපකාර සමිති හා ඒවායේ සේවකයන් ඒ විධිවිධාන පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

*සමුපකාර සමිති සේවක කොමිෂන් සභාවේ විධාන පිළිපැදීමට බැඳී සිටින බව.*

15. යම් සමුපකාර සමිතියක යම් සේවකයෙකු සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කරනු ලබන සියළු විධාන II(2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව අවසානාත්මක විය යුතු අතර, ඒ විධාන ඒ සමිතිය විසින් කරන ලද්දක් මෙන් ඒ සේවකයා ඒවා පිළිපැදීමට බැඳී සිටිය යුතුය.

*මෙම ප්‍රඥප්තිය නිසා ඇතිවන වෙනස්කම්*

16. කොමිෂන් සභාව විසින් අන්‍ය නියමයක් කළහොත් මිස, බස්නාහිර පළාතේ සමුපකාර විෂයභාර ඇමතිවරයා විසින් 1991 සැප්තැම්බර් මස 25 වැනි දින ස්ථාපිත කරන ලද බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් සමුපකාර සමිති සහ ඒවායේ සේවකයන් සම්බන්ධයෙන් නිකුත් කරන ලද නියමයන් සහ නියෝගයන් ඇතුළුව.—

(අ) නිශ්චය කරන ලද වැටුප් ක්‍රම හා සේවා කොන්දේසි ඇතුළු සියළු වර්ග කිරීම් ;

(ආ) සමුපකාර සමිතිවල කාර්යයන් ඉටුකිරීමෙහිලා නිකුත් කරන ලද සියළුම ආකාරයේ විධිවිධානයන් ;

(ඇ) භාරගන්නා ලද සියළුම ආකාරයේ අභියාචනයන් විභාග කිරීමට ආරම්භ කරන ලද හා විභාග නිමාකොට නියෝග නිකුත් කිරීමට අදාළ සියළු අභියාචනයන් ;

(ඈ) ආරම්භ කරන ලද සියළුම ආකාරයේ නීති කෘත්‍යයන් ;

(ඉ) පනවන ලද සියළු රෙගුලාසි සහ නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධානයන් ; සහ

(ඊ) කරන ලද සියළුම පත්කිරීම් හා උසස් කිරීම්.

මෙම ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත කරන ලද සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබූ පරිද්දෙන් වලංගුව බලපැවැත්විය යුතුය.

*සිවිල නිලධාරීන්ගේ සේවා යෝග්‍යතා පරීක්ෂා කිරීම සහ අළුත් සේවා කොන්දේසි නියම කිරීම.*

17. (1) සේවකයෙකු දරන තනතුර දැරීමට ඔහුගේ සාර්ථකභාවය හා යෝග්‍යතාවය සම්බන්ධයෙන් පරීක්ෂණයකින් හෝ අන් ආකාරයකින් කොමිෂන් සභාව සෑහීමකට පත්කරන ලෙස කොමිෂන් සභාව විසින් ඒ හා සම්බන්ධ තනතුරුවල ස්වභාවය වගකීම් හා ක්‍රියාකාරිත්වය අනුව යම් සේවකයෙකුට නියම කළ හැකිය.

එසේ වුවද, කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි යම් වර්ගයක හෝ වර්ගවල සේවකයින්ට පමණක් මෙම උප වගන්තියෙහි ඉහත දක්වෙන විධිවිධාන අදාළ විය යුතුය.

(2) 1 වැනි උප වගන්තිය අදාළ වන තනතුරක් දරන තැනැත්තා ඒ තනතුර දැරීමට තමාගේ සාර්ථකභාවය හා යෝග්‍යතාවය සම්බන්ධයෙන් කොමිෂන් සභාව සෑහීමකට පත්කිරීමට අපොහොසත් වන අවස්ථාවක කොමිෂන් සභාවේ මතය අනුව ඔහුගේ හැකියාවට ගැළපෙන තනතුරක ඔහුගේ කැමැත්ත අනුව ඔහු යෙදීමට කොමිෂන් සභාව උත්සාහ කළ යුතු අතර, ඒ ප්‍රතියෝජනය සිදු නොකෙරුනහොත්, එකල ඔහුට අදාළ වූ සේවා නියමයන් හා කොන්දේසි අනුව හෝ එවැනි නියමයන් නොපවත්වන අවස්ථාවක යුක්ති සහගත කල්දීමක් කිරීමෙන් පසු ඔහු සේවයේ යෙදී සිටි සමුපකාර සමිතිය විසින් ඔහුගේ සේවය අවසන් කරන ලෙස කොමිෂන් සභාව විසින් එහි පරම අභිමතය පරිදි නියම කළ හැකිය.

(3) (1) වැනි උප වගන්තිය අදාළ වන තනතුරක් දරන තැනැත්තා කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන සේවා නියමයන් හා කොන්දේසි පිළිගැනීමට තෝරාගත්තා අවස්ථාවක (1) වැනි උප වගන්තියේ විධිවිධාන අනුව ඔහු විසින් කොමිෂන් සභාව සෑහීමකට පත් කරනහොත් මිස හා එසේ කරන තුරු ඒ සේවා නියමයන් හා කොන්දේසිවලට ඔහුට හිමිකම් නොතිබිය යුතුය.

*පදිංචිය පිළිබඳ සුදුසුකම්.*

18. (1) බස්නාහිර පළාත තුළ යම් දිස්ත්‍රික්කයක සමුපකාර සමිතියක යම් තනතුරකට යටත් පිරිසෙයින් අවුරුදු දෙකක කාලයක්වත් ඒ දිස්ත්‍රික්කය ඇතුළත පදිංචිව නොසිටි කිසිම තැනැත්තෙකු පත් නොකළ යුතුය.

(2) එසේ වුව ද කොමිෂන් සභාවේ මතය අනුව යම් දිස්ත්‍රික්කයක යම් සමුපකාර සමිතියක යම් තනතුරක් සඳහා සුදුසු අපේක්ෂකයෙක් එම දිස්ත්‍රික්කය තුළ නොමැති නම්, පළාත තුළ පිහිටි අනිකුත් දිස්ත්‍රික්කවල අයදුම්කරුවන්ගෙන් සුදුසු පුද්ගලයෙක් එම තනතුර පිරවීම සඳහා පත් කිරීමට එම සමිතියට අවසර දීමට කොමිෂන් සභාවට හැකිය.

*සේවක වැටුප් පරිමාණය සමිති වර්ගය අනුව නිශ්චය කිරීම.*

19. සමුපකාර සමිතියක තනතුරකට පත්කරනු ලැබූ යම් තැනැත්තෙකුට ඒ සමිතියේ වර්ගය අනුව සහ 29(1) වැනි වගන්තිය යටතේ නිශ්චය කරන සේවිකයන්ගේ වර්ග හා පංති අනුව ඒ තනතුරට අදාළ වැටුප් ක්‍රමය දිය හැකිය.

පළාත් රාජ්‍ය සේවයේ පුද්ගලයන් ද්විතියනය කිරීම.

20. මෙම ප්‍රඥප්තියේ අතිකුත් විධිවිධානයන් කිසිවක් ගැන නොතකා ඇමතිවරයාගේ එකඟත්වය සහ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ද, අදාල පුද්ගලයාගේ කැමැත්ත ද ඇතිව පළාත් රාජ්‍ය සේවයේ පුද්ගලයෙකු සමුපකාර සමිතියක ඕනෑම තනතුරකට කොමිෂන් සභාව විසින් පත් කළ හැකිය. එබදු සේවකයන් සදහා ද්විතියනය කරනු ලැබූ පළාත් රාජ්‍ය සේවයේ පුද්ගලයෙකුට එම අරමුණ සදහා එවැනි කාලයක් සදහා අදාල සේවා කොන්දේසි කොමිෂන් සභාවට අනුමත කළ හැකිය.

සමුපකාර සමිති සේවක වැටුප.

21. සෑම සමුපකාර සමිතියක් විසින් එහි මුදල්වලින් එම සමිතියේ සේවකයින්ගේ වැටුප් ද, වෙනත් දීමනා කිසිවක් වෙතොත් ඒ දීමනා ද ගෙවිය යුතුය.

සමුපකාර සමිති සේවක ස්ථානමාරු.

22. (1) සමුපකාර සමිතියකට එම සමිතියේ යම් සේවකයෙකු ඒ සමිතියේ එක් සේවා ස්ථානයකින් එහි අන්කිසි සේවා ස්ථානයකට මාරු කිරීමේ බලය තිබිය යුතු අතර, විනය හේතු නොවන යම් හේතුවක් නිසා මාරු කිරීම් කරනු ලබන අවස්ථාවක ඒ මාරු කිරීම් ඒ සේවකයාගේ පඩිනඩි කෙරෙහි හානිකරව බල නොපෑ යුතුය.

(2) ඒ ඒ සේවා යෝජකයාගේ එකඟත්වය කලින් ලබාගෙන ඇතොත්, සමාන තත්ත්වයේ තනතුරු දරන සේවකයින් දෙදෙනෙකුගේ ඒකාබද්ධ ඉල්ලීම පිට එක් සමුපකාර සමිතියක යම් සේවකයෙකු වෙනත් සමුපකාර සමිතියක සේවකයෙකු වශයෙන් පසුව කී සමුපකාර සමිතියට මාරු කිරීමේ බලය කොමිෂන් සභාවට තිබිය යුතුය.

සේවකයින් සේවයෙන් පහකිරීම සහ දඩුවම් පැනවීම.

23. (1) මේ ප්‍රඥප්තිය හෝ එය යටතේ පනවනු ලැබූ නියෝග කිසිවක විධිවිධාන අනුව හැර යම් සමුපකාර සමිතියක් විසින් ඒ සමුපකාර සමිතියේ කිසිම සේවකයෙකු පහකිරීම හෝ අන් ආකාරයකින් ඔහුට දඩුවම් කිරීම නොකළ යුතුය.

(2) මේ වගන්තියේ සදහන් විධිවිධාන කිසිවකින් මෙම කොමිෂන් සභාව සංස්ථාපනය කිරීමේ දිනයට පෙර සිදුවූ නැතහොත් උද්ගත වූ යම් විෂමාචාරයක් හෝ විනය කඩකිරීමක් හෝ වෙනත් පැමිණිලි නිමිත්තක් හෝ සම්බන්ධයෙන් යම් සමුපකාර සමිතියකට සේවකයෙකුට විරුද්ධව එම විධිවිධාන අනුව පවත්වාගෙන යාම හා අවසන් කිරීම නීත්‍යානුකූල නොවන්නේ යැයි නොසැලකිය යුතුය.

සමුපකාර සමිති සේවක ඇප.

24. (1) කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි යම් මුදලකට වැඩි මුදලක් ඇප වශයෙන් තබන ලෙස සමුපකාර සමිතියක් විසින් යම් සේවකයෙකුට නියම නොකළ යුතු ය.

(2) සමුපකාර සමිතියක යම් සේවකයකු විසින් තබන ලද මුදලක් වූ යම් ඇපයක් සමිතියේ නමින් බැංකුවක තැන්පත් කළයුතු අතර. එයට අයත් වන යම් පොළියක් ඒ සේවකයාට ගෙවිය යුතුය.

සේවකයින්ට අදාල රෙගුලාසි.

25. (1) පහත සදහන් ආකාරයේ, එනම් –

(අ) සමුපකාර සමිතිවල සේවකයන් බඳවා ගැනීම, පත්කිරීම, උසස් කිරීම, මාරු කිරීම, ඔවුන් විසින් ඉල්ලා අස්වීම හා ඔවුන්ගේ සේවාවන් අවසන් කිරීම සම්බන්ධයෙන් ;

(ආ) සේවකයන්ගේ සේවා නියමයන් හා කොන්දේසි නියම කරමින් හා වැටුප් ක්‍රම, දීමනා හා පාරිතෝෂික අත්තිකාරම් දීම, උසස් කිරීම, නිවාඩු, නිලධරයන්ගේ වැඩ තහනම් කිරීම, පත්වීම් අවසාන කිරීම්, සේවයෙන් පහ කිරීමට හෝ ඒ සේවකයන්ට අන්කිසි ක්‍රමයක දඩුවම් පැමිණවීම හා ඊට විරුද්ධව යම් ආයාචනා කිරීම්, සම්බන්ධයෙන් විධිවිධාන සලස්වමින් ; හා

(ඇ) ඒ සේවකයන්ගේ සේවා නියමයන්ට හෝ කොන්දේසිවලට අදාල අවශ්‍ය යැයි සලකනු ලබන වෙනත් කරුණු සම්බන්ධයෙන්

නියෝග පනවනු ලැබිය හැකි ය.

(2) (1) වැනි උප වගන්තියෙහි සදහන් යම් කරුණක් සම්බන්ධයෙන් පනවනු ලබන සෑම නියෝගයක්ම පිළිපැදීමට සමුපකාර සමිති හා ඒවායේ සේවකයන් බැදී සිටිය යුතු ය.

(3) 1981 දෙසැම්බර් 01 දින අංක 169/8 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ සම්පාදිත රෙගුලාසි බස්නාහිර පළාතේ සමුපකාර අමාත්‍යවරයා මගින් රෙගුලාසි සම්පාදනය කරන තෙක් වලංගුව පවතිනු ඇත.

26. පළාත තුළ ක්‍රියාත්මක වන සෑම සමුපකාර සමිතියක් විසින් — සේවකයින් සම්බන්ධයෙන් සමුපකාර සමිතිවල යුතුකම්.

(අ) එහි සෑම සේවකයකු සම්බන්ධයෙන් නියම කරනු ලබන නාමලේඛන හෝ සටහන් තබා පවත්වා ගෙන යායුතු අතර, ඒ එක් එක් සේවකයා සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි සියළු විස්තර එහි සටහන් කළ යුතුය. ;

(ආ) එම සේවකයන් සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි වාර්තා හෝ සටහන් හෝ කොමිෂන් සභාවට අවශ්‍ය වී සපයන ලෙස,කලින් කල නියම කළ හැකි තොරතුරු කොමිෂන් සභාව වෙත සැපයිය යුතුය ; තවද,

(ඇ) සමිතියේ කාර්යාලවලින් යම් කාර්යාලයකට ඇතුළුවී එහි තබාගෙන යනු ලබන පොත්, ගණන් සටහන් හෝ වෙනත් ලේඛන කිසිවක් පරීක්ෂා කිරීමට හා ඒවායේ පිටපත් ගැනීමට බලය පවරනු ලැබූ කොමිෂන් සභාවේ යම් සේවකයකුට හෝ සාමාජිකයෙකුට එසේ කිරීමට ඉඩදිය යුතු ය.

27. සේවා යෝජකයකු සෑම සමුපකාර සමිතියක්ම හා ඒ සමිතියේ සෑම සේවකයකු විසින් නීතියෙන් නියම කරනු ලැබිය හැකි වූ යම් මුදලක් වාරපතා දයක මුදල් වශයෙන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු ය. අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල

28. සේවය ගන්නා ලද්දේ මෙම ප්‍රඥප්තිය පනවනු ලැබූ දිනයට පෙර වුවද, පසුවුව ද, සියළු සේවකයින් ඔවුන් සේවය ගන්නා ලද්දේ යම් සමිතියක් විසින් ද, ඒ සමිතියේ සේවකයන් බව ඒ සමිතියේ සේවයෙහි නියුක්ත බව හා ඒ සමිතියට පක්ෂපාත විය යුතු බව සැකදුරුවීම පිණිස මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. සමුපකාර සේවකයින් කොමිෂන් සභාවේ නොව සමිතියේ සේවකයින් බව.

## 3 වැනි කොටස

## කොමසාරිස්වරයාගේ බලතල

29. (1) සමුපකාර සමිතිවල තනතුරු සඳහා වැටුප් ක්‍රම නියම කිරීමේ කාර්යය සඳහා එක් එක් සමුපකාර සමිති වර්ග කිරීමේදී යම් සමුපකාර සමිතියක සේවකයන්ගේ වර්ග හා පත්ති සහ ඒ එක් එක් වර්ගයේ හා පත්තියේ විය යුතු සේවකයින්ගේ ගණන නිශ්චය කිරීමේ දී තමා සුදුසු යැයි සලකන අන්දමින් කලින් කල එය වෙනස් කිරීමේ බලය කොමසාරිස්ට තිබිය යුතුය. කොමසාරිස් විසින් සමිති වර්ගකළ යුතු බව හා කාර්ය මණ්ඩලය නිශ්චය කළ යුතු බව.

(2) 1 වැනි උප වගන්තිය යටතේ කොමසාරිස් විසින් කරනු ලබන නිශ්චය කිරීම කඩකරමින් කිසිම සමිතියක් විසින් කිසිම තැනැත්තෙකු සේවයට නොගත යුතුය.

30. කොමිෂන් සභාව විසින් සමුපකාර සමිතිවල යම් තනතුරකට පත්කිරීමට අවශ්‍ය සුදුසුකම් නිශ්චය කිරීම ද, යම් පත්තියක හෝ යම් වර්ගයක යම් තනතුරකට හෝ තනතුරුවලට අනුයුක්ත කළයුතු වැටුප් ක්‍රම නියම කිරීම ද, ඒ වැටුප් ක්‍රම කලින් කල ප්‍රතිශෝධනය කිරීම ද, කොමසාරිස්ගේ එකඟත්වය ඇතිව කළ යුතුය. සුදුසුකම්, වැටුප් ක්‍රම ආදිය පිළිබඳව කොමිෂන් සභාව කොමසාරිස්ගේ එකඟත්වය ලබා ගත යුතුය.

## 4 වැනි කොටස

## විවිධ කරුණු

31. මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී මේ ප්‍රඥප්තියේ කිසිම විධිවිධානයක් හෝ සාර්ථක විධිවිධාන සලස්වා නොමැති යම් කරුණක් හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් යම් සැකයක් හෝ දුෂ්කරතාවක් උද්ගත වුවහොත් ඇමතිවරයා විසින් ආඥාවක් මගින් ඒ සැකය ඉවත් කළහැකිය. නොහොත් නිශ්චය කළ හැකිය. එවැනි සෑම ආඥාවක්ම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර, එසේ කරනු ලැබීමෙන් පසු එයට නීතිමය බලය තිබිය යුතුවාක් හැර මෙහිලා පනවනු ලැබූවාක් මෙන් වලංගුව බලපැවැත්විය යුතුය. දුෂ්කරතා ඉවත් කිරීම.

32. (1) ප්‍රකාශිතව අන් ආකාරයක විධිවිධාන සලස්වන ලද්දේ නම් මිස නියෝග පැනවීමට මේ ප්‍රඥප්තිය යටතේ බලය පවරා ඇත්තේ හෝ නියම කර ඇත්තේ යම් කරුණු සඳහා හෝ සම්බන්ධයෙන් ද, ඒ සියළු කරුණු සහ නියම කළයුතු මේ ප්‍රඥප්තියෙන් ප්‍රකාශ කර හෝ නියම කර ඇති සියළු කරුණු සඳහා වූ නියෝග ඇතුළුව මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා හෝ එහි ප්‍රතිපත්ති ඵලගැන්වීම සඳහා අවශ්‍ය බව කොමිෂන් සභාවට පෙනීයා හැකි සියළු නියෝග කොමිෂන් සභාව විසින් පැනවිය හැකිය. කොමිෂන් සභාව විසින් නියෝග පැනවිය හැකි බව.

(2) එවැනි කිසිම නියෝගයක් බස්නාහිර පළාත් සභාව විසින් අනුමත කොට ඇමතිවරයා විසින් එය අනුමත කරනු ලබනතුරු හා ඒ අනුමැතිය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළකරනු ලබනතුරු බල නොපැවැත්විය යුතුය.

(3) යම් නිවේදනයක් (2) වැනි උප වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ විට ඒ නිවේදනය අදාළ වන නියෝගය එය මෙහිලා පනවනු ලැබූවක් මෙන් වලංගුව බල පැවැත්විය යුතුය.

කොමිෂන් සභාවේ සාමාජික පුද්ගලයන්ගේ නිදහස.

33. කොමිෂන් සභාවේ යම් සාමාජික පුද්ගලයෙකු විසින් ඒ සාමාජිකයා වශයෙන් හෝ නීතිගත සංස්ථා තත්ත්වයෙන් කොමිෂන් සභාව විසින් ගන්නා ලද යම් තීරණයක් හෝ කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජික පුද්ගලයාට විරුද්ධව කිසිම සිවිල් නඩුවක්, අපරාධ නඩුවක් හෝ සිවිල් හෝ අපරාධ අත්කිසි කෘත්‍යයක් පැවරීම හෝ පවත්වා ගෙන යාම නොකළ යුතුය.

ගිවිසුම්ගත හෝ අනියම් හෝ දවස් පඩි ගෙවන සේවකයින් සේවයේ යෙදවීම.

34. මේ ප්‍රඥප්තියේ විධිවිධාන ගැන නොතකා සමුපකාර සමිතියක් විසින් එහි කාර්යක්ෂම ක්‍රියාකාරිත්වයේ දියුණුව පිණිස —

(අ) කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ඇතිව ගිවිසුම් පදනමක් පිට යම් නිශ්චිත කාලයකට ප්‍රවීනයකුගේ හෝ විශේෂඥයෙකුගේ සේවය ලබාගත හැකිය ; නැතහොත්

(ආ) අනියම් හෝ දවස් පඩි ගෙවන සේවකයන් හෝ කෑලි මිම්මේ පදනම පිට ගෙවන සේවකයින් සේවයෙහි යොදවා ගත හැකිය.

එසේ වුවද, කොමිෂන් සභාවේ එකඟත්වය නොමැතිව එවැනි සේවකයන්ට තනතුරේ කිසිම ස්ථිර සේවයක් නොදිය යුතුය.

වැරදි.

35. (1) (අ) මෙම පනතේ විධිවිධාන කඩකරන ; හෝ

(ආ) කරන ලෙස කොමිෂන් සභාව විසින් නියම කරන යම් ක්‍රියාවක් හෝ මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා කොමිෂන් සභාව හෝ යථා පරිදි බලය පවරනු ලැබූ අන් තැනැත්තෙකු සපයන ලෙස නියම කරන යම් තොරතුරක් සැපයීම ඕනෑකමින් නොසළකා හරින හෝ ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින ; හෝ

(ඇ) ඕනෑකමින් අසත්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන හෝ අසත්‍ය තොරතුරු සපයන,

යම් සමුපකාර සමිතියක් හෝ එහි යම් නිලධාරියෙකු හෝ සේවකයෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකරු විය යුතුය.

(2) (i) වැනි වගන්තියෙහි සඳහන් යම් වරදක් කරන සෑම සමුපකාර සමිතියක් ම හෝ සෑම තැනැත්තෙකු ම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතුය.

(3) මෙම ප්‍රඥප්තිය යටතේ වූ යම් වරදක් සමුපකාර සමිතියක් විසින් කරනු ලැබූව අවස්ථාවක ඒ සමිතියේ සෑම නිලධාරියෙකු ම ඒ වරද කර ඇත්තේ තම දැනුම නොමැති බව හෝ වරද කිරීම වැළැක්වීම පිණිස නිසි සියළු උද්‍යෝගයෙන් තමා ක්‍රියා කළ බව ඔහු විසින් ඔප්පු කර ගතහොත් මිස ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතුය.

(4) යම් සේවකයෙකු නැවත සේවයට ගැනීම නියම කරමින් කොමිෂන් සභාව විසින් දෙනු ලැබූ උපදෙස් කිසිවක් අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම පිළිබඳව සමුපකාර සමිතියක් වරදකරු කරනු ලැබූ විට ඒ සමුපකාර සමිතිය —

(i) (2) වැනි උප වගන්තිය යටතේ එයට නියම කරනු ලැබිය හැකි යම් දඩ දඬුවමකට අතිරේකව ඒ වරද සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබීමෙන් පසු ඒ පැහැර හැරීම ඉදිරියටත් පවත්වාගෙන යන එක් එක් දිනය සඳහා රුපියල් සියයක දඩයක් ගෙවීමට ; හා

(ii) ඒ එක් එක් දඩයෙහි හා කොමිෂන් සභාවේ උපදෙස් අනුව ඒ සේවකයා නැවත සේවයට බඳවා ගත යුතුව තිබූ දිනයෙන් ආරම්භව ඒ සමුපකාර සමිතිය වරදකරු කරනු ලැබූ දිනයෙන් අවසන් වූ කාලපරිච්ඡේදයේ එක් එක් දවසෙහි ඒ සේවකයා සේවයේ යෙදී සිටියේ නම් ඔහුගේ සේවය අවසන් කරනු නොලැබ තිබිණි නම්, ඔහුට හිමිකම් තිබුණු වැටුපෙහි හෝ වේතනයෙහි ප්‍රමාණය අනුව ගණන් බලනු ලැබූ පාරිශ්‍රමිකය ඒ සේවකයාට ගෙවීමට යටත් විය යුතුය. සමුපකාර සමිතියක් මේ උප වගන්තිය (II) ඡේදය යටතේ ගෙවීමට යටත්වන යම් මුදලක් ඒ සමුපකාර සමිතිය වරදකරු කරනු ලැබූ උසාවිය විසින් ඒ සමිතියට නියම කරනු ලැබූ දඩයක් ලෙය ඒ උසාවියේ ආඥාවක් පිට අයකර ගනු ලැබිය හැකි අතර, එසේ අයකර ගන්නා මුදල ඒ සේවකයාට ගෙවිය යුතුය.

36. තම රාජකාරිය කිරීමේ දී හැර නියමින් හෝ අනියමින් තමා විසින් ම හෝ අන් තැනැත්තෙකු මාර්ගයෙන් කවර හෝ ආකාරයකින් කොමිෂන් සභාවේ යම් තීරණයක් කෙරෙහි යම් සාමාජිකයෙකු කෙරෙහි බලපෑමක් කරන හෝ බලපෑමක් කිරීමට තැත් කරන සෑම තැනැත්තෙකු ම වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි ලඝු නඩු විභාගයකින් පසු වරදකට වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයක් හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයකට බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ බන්ධනාගාර ගත කිරීම යන දෙකටම යටත් විය යුතුය. කොමිෂන් සභාවේ කටයුතුවලට මැදිහත්වීම.

37. කොමිෂන් සභාවේ කිසිම සාමාජිකයෙකු, කොමිෂන් සභාවේ ලේකම්, කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයෙකු හෝ අන් කවර තැනැත්තෙකු විසින් වුව ද තම නිල කාර්යයන් කිරීමෙහිලා නොවන අන් ආකාරයකින් තමාගේ රාජකාරි ඉටු කිරීමේ දී තමාට දැන ගන්නට ලැබුණ කවර හෝ ලේඛනයක්, සංදේශයක් හෝ තොරතුරක් පළ කිරීම හෝ අන් තැනැත්තකුට එළිදරව් කිරීම නොකළ යුතු ය. බලය නොමැතිව තොරතුරු හෙළිදරව් කිරීම තහනම් බව.

38. කොමිෂන් සභාව හෝ යම් සාමාජිකයෙකු හෝ නිලධාරියෙකු හා යම් සමුපකාර සමිතියක් හෝ ඒ සමුපකාර සමිතියේ පාලන කාරක සභාවේ යම් සාමාජිකයෙකු හෝ එහි නිලධාරියෙකු හා අතර, හෝ කොමිෂන් සභාවේ යම් සාමාජිකයෙකු හෝ නිලධරයකු හා අතර, කොමිෂන් සභාවේ කාර්යයන් අතුරෙන් යම් කාර්යයක් කිරීමෙහි ලා හෝ ඒ කාර්යය කිරීම සම්බන්ධයෙන් හුවමාරු වූ ලිඛිත හෝ වාචික යම් සංදේශයක් යම් නීති කෘත්‍යයක දී ඉදිරිපත් කරන ලෙස එළිදරව් කරන ලෙස එසේ ඉදිරිපත් කිරීමට හෝ එළිදරව් කිරීමට සභාපති ලියවිල්ලකින් කැමැත්ත දෙනහොත් මිස කිසිම තැනැත්තෙකුට අවසර නොදිය යුතු ය. නැතහොත්, බල නොකළ යුතුය. කොමිෂන් සභාවේ සංදේශ වරප්‍රසාද යුක්ත බව.

39. (1) යම් සේවා නියුක්තයකු විසින් යම් කරුණක් සම්බන්ධයෙන් සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්නම්, එම කරුණ සම්බන්ධයෙන් හෝ සාරානුකූලව එම කරුණ සම්බන්ධයෙන් හෝ කාර්මික ආරවුල් පනතේ 31ආ වගන්තිය යටතේ එම සේවා නියුක්තයා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක්, එම පනත යටතේ පිහිටවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් භාර නොගත යුතුය. සමුපකාර සමිති සහ ඒවායේ සේවා නියුක්තයන් සම්බන්ධයෙන් කාර්මික ආරවුල් පනත අදාලවීම.

(2) කාර්මික ආරාවුල් පනත යටතේ පිහිටවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාරයන් වෙත යම් සේවා නියුක්තයකු විසින් යම් කරුණක් සම්බන්ධයෙන් එම පනතේ 31 ආ වගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇත්නම්, එම කරුණ සම්බන්ධයෙන් හෝ සාරානුකූලව එම කරුණ සම්බන්ධයෙන් හෝ එම සේවා නියුක්තයා විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් කොමිෂන් සභාව විසින් භාර නොගත යුතුය.

40. (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි "කොමිෂන් සභාව" යනුවෙන් බස්නාහිර පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාව අදහස් වේ. පද සම්බන්ධය.

"කොමසාරිස්" යන්නෙන් බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් අදහස් වේ.

"සමුපකාර සමිතිය" යන්නෙන් සමුපකාර සමිතිවලට අදාළ නීතිය යටතේ ලියාපදිංචි සහ බස්නාහිර පළාත තුළ ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන, බස්නාහිර පළාත තුළ ක්‍රියාත්මක වන සමිතියක් බව අදහස් කෙරේ.

"දිස්ත්‍රික්කය" යන්නෙන් අදහස් කෙරෙන්නේ බස්නාහිර පළාත තුළ පිහිටි පරිපාලන දිස්ත්‍රික්කයක් වේ.

"සේවකයා" යන්නෙන් මෙම ප්‍රඥප්තියේ අර්ථානුකූලව සමුපකාර සමිතියක සේවකයෙක් යන්න අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ බස්නාහිර පළාතේ සමුපකාර සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාගේ යුතුකම් ඉටුකිරීම සඳහා පත්කරන ලද තැනැත්තා වශයෙන් අදහස් කෙරේ.

"නියම කරනු ලබන" යන්නෙන් කොමිෂන් සභාව විසින් පනවන ලද නියෝගවලින් නියමිත බව අදහස් වේ.

(2) මෙම ප්‍රඥප්තිය අවබෝධයෙහි ව්‍යාකූල තත්ත්වයක් වේ නම් සිංහල අනුවාදයේ සංනිවේදනය, අදහස හා තේරුම් බලපානු ලැබේ.

අතීතයට බලපාන පරිදි ක්‍රියාත්මක කිරීම.

41. මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම 1991 සැප්තැම්බර් මස 1 වැනි දින ආරම්භ වූ අතර එසේ ආරම්භ වූ බව සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය. ඒ අනුව, මේ ප්‍රඥප්තියේ ඉහත දක්වෙන 3 සහ 4 (1) සහ (2) වැනි වගන්තිය ප්‍රකාර (බස්නාහිර පළාතේ) සමූපකාර සේවක කොමිෂන් සභාව සහ එහි සාමාජිකයන් තිදෙනා පත්කිරීමට බලතල සහ අධිකාරය 1991 සැප්තැම්බර් මස 01 වැනි දින දී එදින සිට අමාත්‍යවරයා වෙත පවරා තිබුණු ලෙසත් ඒ අනුව අමාත්‍යවරයා විසින් (බස්නාහිර පළාතේ) සමූපකාර සේවක කොමිෂන් සභාව සහ එහි සාමාජිකවරුන් තිදෙනා 1991 සැප්තැම්බර් මස 25 වැනි දින පත්කරනු ලැබීම සහ ඒ පත්කිරීම 1991 ඔක්තෝබර් මස 25 වැනි දින අංක 686 දරන **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය** මගින් නිවේදනය කිරීම නීත්‍යානුකූලව වලංගු වන අතර එසේ වලංගුව පැවති ලෙස සහ වලංගුව පවත්නා ලෙසත් (බස්නාහිර පළාතේ) සමූපකාර සේවක කොමිෂන් සභාව මේ ප්‍රඥප්තිය ප්‍රකාර නීත්‍යානුකූලව වලංගුව පිහිටුවා තිබුණු ලෙසත් සලකනු ලැබිය යුතුය.

උපලේඛනය

**කොමිෂන් සභාවේ සාමාජිකයෙකු විසින් කළයුතු දිවුරුම් ප්‍රකාශය**

................................................................................ වන මම සමූපකාර සේවක කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් පත්කිරීම හේතුකොට ගෙන බස්නාහිර පළාතේ සමූපකාර සේවක කොමිෂන් සභාවේ සභාපති/සාමාජික වශයෙන් එම තනතුරේ කටයුතු අපක්ෂපාතීව, භීතියකින්, හිතවත්කමකින් හෝ ද්වේශයකින් තොරව ඉටු කරන බවත්, එසේ කිරීමේ දී ඊට අයත් කිසිම කරුණක් ගැන කිසිම දෙයක්, රාජකාරියට විනා වෙනත් පුද්ගලයෙකුට කෙලින්ම හෝ වක්‍රව අනාවරණය නොකරන බවත්, මෙයින් ගරු ගාම්භීර පූර්වකවත්/අවංකවත් දිවුරා ප්‍රකාශ කර සිටිමි/ප්‍රතිඥා දෙමි.

199....... ක්වූ ................................................ මස ................. වැනි දින මා ඉදිරියේ දිවුරා ප්‍රකාශ කරන ලදී./ප්‍රතිඥා දෙන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරතුමා.

**කොමිෂන් සභාවේ නිලධාරියෙකු විසින් කළ යුතු දිවුරුම් ප්‍රකාශය**

................................................................................ වන මම, බස්නාහිර පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ ලේකම්/නිලධාරියෙකු වශයෙන් රාජකාරී කටයුතු ඉටු කිරීමට නියම වීම කරණ කොටගෙන එම ලේකම්/නිලධාරී තනතුරේ රාජකාරී කටයුතු ඉටුකිරීමේ දී රාජකාරියට අදාලව විනා, වෙනත් කවර විටක දී හෝ කවර ආකාරයක හෝ කරුණක් හෝ එහි කොටසක් කිසිම පුද්ගලයෙකුට කෙලින්ම හෝ වක්‍රව අනාවරණය නොකරන බවට මෙයින් ගරු ගාම්භීරව/ දිවුරා ප්‍රකාශ කර සිටිමි/ප්‍රතිඥා දෙමි.

199......ක් වූ ........................................ මස.............................................. වැනි දින මා ඉදිරියේදී දිවුරා ප්‍රකාශ කරන ලදී./ප්‍රතිඥා දෙන ලදී.

සභාපති,
බස්නාහිර පළාතේ, සමූපකාර සේවක කොමිෂන් සභාව.

08—137